කැලණිය දුරුතු මහා පෙරහැර මංගල්‍යය
ද්විතීය යුග ශත සංවත්සරය 1927- 2027
සංචාරක ගැලරිය

Press Release - Kelaniya Duruthu Maha Perahera 2027 Tourist Enclosure

100th Kelaniya Duruthu Maha Perahera opens a 400-seat Tourist Enclosure to international visitors

*Bookings are open at www.kelaniyaperahara.com for the centenary procession on 21 January 2027*

Kelaniya, 11 October 2026 — The historic Kelaniya Raja Maha Viharaya today launched the Tourist Enclosure for the 100th Kelaniya Duruthu Maha Perahera, opening 400 reserved seats to international visitors. The grand procession takes place on Thursday, 21 January 2027 at 7.30 p.m. The launch was held at the temple before travel agents, tour operators, hoteliers and the media. The centenary Perahera is held under the guidance and blessings of the Chief Incumbent of the Kelaniya Raja Maha Viharaya, Agga Maha Panditha, Mahopadhyaya, Professor Emeritus, Most Venerable Kollupitiye Mahinda Sangharakkhitha Nayaka Thero, together with Venerable Professor Deniyaye Pannaloka Buddharakkhitha Thero.

Kelaniya is one of the most sacred Buddhist sites in Sri Lanka, venerated as the place the Buddha visited on his third visit to the island. The second era of the Duruthu Maha Perahera began in 1927 through the efforts of the philanthropist Don Walter Wijewardene, son of Helena Wijewardene. The 2027 procession completes the Century of the Second Era, 1927 to 2027. The sacred relic casket is carried by Kandula, the temple's tusker, and is followed by the three devala processions of Vishnu, Kataragama and Vibhishana. Caparisoned elephants, traditional dancers, drummers, fire performers and whip crackers accompany the relics through the night.

The Tourist Enclosure gives overseas guests a reserved seat with an uninterrupted, front-facing view of the procession. Each ticket includes live commentary on the procession, complimentary Ceylon tea, coffee and bottled water, dedicated parking and a priority entrance. The seating is also placed for clear photography and filming. The organisers expect 400 visitors from Germany, the United Kingdom, France, India and other markets. Sri Lankan guests are also welcome to book.

Seats can be booked at www.kelaniyaperahara.com. Travel agents, tour operators and hotels can arrange group bookings directly with the organising committee.

Media and trade contact


- Tourist Enclosure Committee, Kelaniya Duruthu Maha Perahera 2027
- Kelaniya Raja Maha Viharaya, Kelaniya, Sri Lanka
- Telephone: +94 11 291 1505 / +94 77 250 7000
- Email: info@kelaniyaperahara.com
- Web: www.kelaniyaperahara.com


– ENDS –

කැලණිය දුරුතු මහා පෙරහැර මංගල්‍යය
ද්විතීය යුග ශත සංවත්සරය 1927 - 2027
සංචාරක ගැලරිය

මාධ්‍ය නිවේදනය - කැලණිය දුරුතු මහ පෙරහැර 2027

**සියවැනි කැලණි දුරුතු මහ පෙරහැර නැරඹීමට විදෙස් සංචාරකයන් සඳහා ආසන 400ක සංචාරක ගැලරියක්**

*2027 ජනවාරි 21 වැනිදා වීදි සංචාරය කරන මහ පෙරහැර සඳහා ආසන වෙන්කිරීම් www.kelaniyaperahara.com ඔස්සේ ආරම්භ වෙයි*

කැලණිය, 2026 ඔක්තෝබර් 11 — ඓතිහාසික කැලණි රජමහා විහාරයේ සියවැනි දුරුතු මහ පෙරහැර නැරඹීමට පැමිණෙන විදෙස් සංචාරකයන් වෙනුවෙන් සකස් කෙරෙන සංචාරක ගැලරිය (Tourist Enclosure) අද (11) කැලණි රජමහා විහාරස්ථානයේ දී නිල වශයෙන් එළිදැක්විණි. සංචාරක නියෝජිත ආයතන, සංචාරක මෙහෙයුම්කරුවන්, හෝටල් ක්ෂේත්‍රයේ නියෝජිතයන් සහ මාධ්‍ය ආයතන රැසක් මෙම අවස්ථාවට සහභාගි වූහ. මහ පෙරහැර 2027 ජනවාරි 21 වැනි බ්‍රහස්පතින්දා රාත්‍රී 7.30ට වීදි සංචාරය කරන අතර, ඒ සඳහා වෙන් කළ ආසන 400ක් විදෙස් අමුත්තන්ට විවෘත කර තිබේ. සියවැනි පෙරහැර මංගල්‍යය පැවැත්වෙන්නේ කැලණි රජමහා විහාරාධිපති, අග්ගමහා පණ්ඩිත, මහෝපාධ්‍යාය, සම්මානිත මහාචාර්ය අතිපූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා සහ ආශීර්වාදය මත, මහාචාර්ය පූජ්‍ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේගේ මඟපෙන්වීම ද ඇතිවය.

බුදුරජාණන් වහන්සේ තෙවැනි වරට ලංකාද්වීපයට වැඩම කළ අවස්ථාවේ සිරිපා පහස ලැබූ කැලණිය, මෙරට බෞද්ධයන්ගේ අතිපූජනීය සිද්ධස්ථානයකි. කැලණි දුරුතු මහ පෙරහැරේ දෙවැනි යුගය ආරම්භ වූයේ 1927 වසරේ දී, හෙලේනා විජේවර්ධන ළමාතැනියගේ පුත් දානපති දොන් වෝල්ටර් විජේවර්ධන මැතිතුමාගේ පුරෝගාමීත්වයෙනි. ඒ අනුව 2027 පෙරහැර, දෙවැනි යුගයේ සියවස (1927–2027) සනිටුහන් කරයි. සර්වඥ ධාතූන් වහන්සේලා වැඩ සිටින කරඬුව විහාරස්ථානයේ කණ්ඩුල හස්තිරාජයා පිට වැඩම කරවන අතර, ඉන් පසුව විෂ්ණු, කතරගම සහ විභීෂණ යන දේවාල පෙරහැර තුන ගමන් කරයි. සැරසූ අලි ඇතුන්, සාම්ප්‍රදායික නර්තන ශිල්පීන්, බෙර වාදකයන්, ගිනි බෝල සහ කස කරුවන් රැසක් පෙරහැර වර්ණවත් කරති.

සංචාරක ගැලරියේ දී විදෙස් අමුත්තන්ට බාධාවකින් තොරව පෙරහැර ඉදිරිපසින්ම නැරඹිය හැකි වෙන් කළ ආසනයක් හිමි වේ. පෙරහැර පිළිබඳ සජීවී විස්තර විචාරය, නොමිලේ පිරිනැමෙන ලංකා තේ, කෝපි සහ පානීය ජලය, වෙන් කළ වාහන නැවැත්වීමේ පහසුකම් සහ ප්‍රමුඛතා ප්‍රවේශ දොරටුවක් ද සෑම ප්‍රවේශපත්‍රයකටම ඇතුළත් ය. ඡායාරූප සහ වීඩියෝ ගැනීමට ද මෙම ආසන මනා ලෙස පිහිටා ඇත. ජර්මනිය, එක්සත් රාජධානිය, ප්‍රංශය සහ ඉන්දියාව ඇතුළු රටවලින් පැමිණෙන සංචාරකයන් 400 දෙනකු මෙවර අපේක්ෂා කෙරේ. දේශීය අමුත්තන්ට ද ආසන වෙන් කර ගත හැකිය.

ආසන වෙන්කිරීම් www.kelaniyaperahara.com නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කළ හැකිය. සංචාරක නියෝජිත ආයතන, සංචාරක මෙහෙයුම්කරුවන් සහ හෝටල්වලට සමූහ වෙන්කිරීම් සඳහා සංවිධායක කමිටුව සෘජුවම සම්බන්ධ කර ගත හැකිය.

මාධ්‍ය සහ සංචාරක ක්ෂේත්‍රයේ විමසීම් සඳහා


- සංචාරක ගැලරි කමිටුව, කැලණි දුරුතු මහ පෙරහැර 2027
- කැලණි රජමහා විහාරය, කැලණිය
- දුරකථන: +94 11 291 1505 / +94 77 250 7000
- විද්‍යුත් තැපැල: info@kelaniyaperahara.com
- වෙබ් අඩවිය: www.kelaniyaperahara.com


– නිමි –